
# අභිරහස් නිධානය



පී.සනුති සෙහන්සා



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන **“හේමමාලා උපහාර”** ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.

මෙවර වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක්, සන්නිවේදන නිපුණතා, සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලිවීමට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්, මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුදකරමු.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනි
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර,එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව,සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි.එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.<br>
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.<br>
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# ෑ: අභිරහස් නිධානය

එකෝමත් එක රටක ලස්සන පුංචි නගරයක් තිබුණා. මේ නගරයේ පාලකයා තමයි බැරෙන්ඩා සොයිසා. මෙයාට හිටියා ලිලී සොයිසා කියලා ලස්සන හුරුබුහුටි පුංචි ගැහැනු ළමයෙක්. ලිලීගේ හුරුබුහුටිකම නිසා ම නෑදෑයෝ, නගරයේ හිටපු අසල්වැසියෝ, දෙමව්පියෝ  වගේ ම ඉස්කෝලේ යහළුවෝ, ගුරුවරු හැමෝ ම ලිලීට ආදරය කළා. ලිලීගේ කරුණාවන්තකමත් ඒකට උදවු වුණා. ඒ වගේ ම ලිලී හරි ම බුද්ධිමත් . ඒ නිසා ම හොදට ඉගෙන ගන්නත් පුළුවන් වුණා. ලිලීට වයස අවුරුදු අටයි. ලිලී ඉගෙන ගත්තෙ ඒ නගරයේ තියෙන හොඳ ම පාසලක් වුණ කේ/නයනතාරා බාලිකා විදුහලයේ තුන වසරේ.

ලිලීගේ හොද ම  යාළුවාගේ නම ඇනා . ඇනාටත් වයස අවුරුදු අටයි . ඇනා ඉගෙන ගත්තෙත් ලිලී ඉගෙන ගන්න පාසලේමයි. ලිලීයි ඇනායි එක ම පන්තියේ හොද ම යාළුවෝ දෙදෙනෙක්. ඇනාත් ලිලී වගේම හොදට ඉගෙන ගන්න, හරි ම කරුණාවන්ත හොද ළමයෙක්.

මේ දෙදෙනාගේ පන්ති භාර ගුරුතුමිය, ඒ කියන්නේ එලී ටීචර් දවසක් ලස්සන කතන්දරයක් කියලා දුන්නා. ඒ කතන්දරේ කියවුණේ ලොකු ම ලොකු නිධානයක් හොයන්න ගිය පුංචි ම පුංචි ළමයි දෙදෙනෙක් ගැන .

"ඊට පස්සේ ඒ ළමයින්ගේ දෙමව්පියෝ ඒ නිධානය විකුණලා පොහොසත් වුණා . '' එලී ටීචර් මේ කතාව ඉවර කරන කොට ම එක ළමයෙක් මෙහෙම ඇසුවා

" ටීචර් එතකොට අපිට පුළුවන් ද ඉස්කෝලේ දි නිධන් හෑරීමේ තරගයක් තියන්න ? ''

" හපොයි පුළුවන් . මොකද බැරි ළමයි ? '' එලී ටීචර් කිවුවා

" යේ..............යේ................ ''ළමයි කෑ ගැසුවා

" හොඳයි ළමයි, එහෙනම් අපි හෙට නිධන් සෙවීමේ තරගයක් තියමු. මම දැන් ඔයාල කණ්ඩායම්වලට බෙදන්නම් . ලිලී , ඇනා , සැමී , මලිති ඔයාලා එක කණ්ඩායමක් .......... හැම කණ්ඩායමකට ම මම හෙට සිතියමක් දෙනවා . ඔයාලා හැමෝ ම සූදානම් වෙලා එන්න ළමයි '' එලී ටීචර් කිවුවා .

" ට්‍රිලිං ............ ට්‍රිලිං .......... '' සීනුව නාද වුණා.

" ළමයි ඔයාලා හැමෝ ම දැන් ගෙදර යන්න . ආයුබෝවන් ළමයි . '' එලී ටීචර් කිවුවා .

" ආයුබෝවන් ටීචර් '' ළමයි එසේ කියමින් නිවෙස් වෙත දිව ගියේ ඉතා ම සතුටින් .

ලිලීටයි , ඇනාටයි එදා හරි ම සතුටු දවසක්. ලිලීයි, ඇනායි හැමදා ම ඉස්කෝලේ ඇරලා ගෙදර යන්නේ එකට. එදා මේ දෙන්නා ගෙදර යන ගමන් මෙහෙම කතා කළා .

" ඇනා මට නම් හරි ම සතුටුයි . අපි දෙන්න ම එක ම කණ්ඩායමේ වෙච්චි එක කොයි තරම් දෙයක් ද ? '' ලිලී කීවේ සතුට දරා ගත නොහැකි අන්දමටයි .

" ඔව් ලිලී , එලී ටීචර්ටත් හිතෙන්න ඇති අපි දෙන්න ව එකට දැම්මොත් වැඩේ තවත් ලේසි වෙයි කියලා'' ඇනා කීවේ සිනා සෙමිනි .

ලිලීගේ ගෙදර ළඟට ලං වුණා .

" ලිලී එහෙනම් මම යනවා.හෙට හම්බ වෙමු.''

" හොඳයි එහෙනම් හෙට හම්බ වෙමු .පරිස්සමින්.''

ගෙදර ගිහින් ලිලී කල්පනා කළේ මේ නිධන් තරගය ගැනමයි. රෑ කෑම කන වෙලාවත් ලං වුණා . රෑ කෑම කන ගමන් මේ ගැන අම්මාට කියන්න ලිලී අමතක කළේ නෑ.

" අම්මේ, අපේ එලී ටීචර් කිවුවා හෙට නිධන් හොයන තරඟයක් තියෙනවා කියලා . මට නම් හරි ම සතුටුයි. මම ,ඇනා ,මලිති ,සැමී අපි ඔක්කොම එක ම කණ්ඩායමේ .''

"එහෙනම් දැන් දුව කාලා ඉවර වෙලා ඉක්මනින් ගිහින් නිදා ගන්න. '' අම්මා ලිලීට කිවුවා .

" හරි අම්මේ . සුබ රාත්‍රියක් වේවා. ''

" සුබ රාත්‍රියක් ලිලී .''

ලිලී නින්දට ගියා . ටික වෙලාවක් යද්දි ජනේලය ළඟින් ලිලීට අමුතු සද්දයක් ඇසුණා . ලිලී බය වෙලා නින්දෙන් ඇහැරුණා . ලිලී ජනේලය ඇරලා බැලුවා . එතැන හිටියා හරි ම ලස්සන පුදුම අශ්වයෙක් . ඒ අශ්වයාගේ පිට උඩ ලිලීගේ හොඳ ම යාළුවා ඇනා හිටියා . ලිලී පුදුම වුණා .

“ ඇනා , ඔයා මොකද මෙහෙ කරන්නේ ? ’’ ලිලී පුදුමයෙන් ඇසුවා .

“ ලිලී මට හම්බ වුණා පුදුම අශ්වයෙක් . අපි යමු නිධානය හොයන්න . එන්න නගින්න . ’’ ඇනා ලිලීට කිවුවා .

“ පොඩ්ඩක් ඉන්න. මොන නිධානයක් ද ? කොහෙ තියෙන නිධානයක් ද ? ’’ ලිලී බය වෙලා ඇසුවා .

“ හරි , හරි , මම පැහැදිලි කරන්නම් . මේ පුදුම අශ්වයා මට දුන්නා සිතියමක් . අපි මේ සිතියමෙන් කියවෙන පැත්තට ගිහින් නිධානය හොයා ගනිමු . ඔයා ඉස්සල්ලා ම නගින්නකෝ ඊට පස්සෙ මම ඔයාට සිතියම පෙන්වන්නම් . ’’ ඇනා කිවුවා .



ලිලී බොහො ම සතුටින් පුදුම අශ්වයාගේ පිට උඩට නැග්ගා . පුදුම අශ්වයා යන්න පිටත් වුණා. ඇනා ලිලීට සිතියම පෙන්වුවා .

“ මේ බලන්න ඇනා , මේ සිතියමේ තියෙන විදිහට අපි ඉන්නෙ මේ රතු පාට තිත තියෙන තැන . මුලින් ම අපිට ලොකු කැලෑවක් මැද්දෙන් තමයි යන්න තියෙන්නේ . ඊට පස්සෙ ලොකු ගඟකින් එගොඩ වෙන්නත් තියෙනවා . ඊට පස්සෙ අපිට ලොකු කන්දක් නැගලා ඒ කන්ද උඩ තියෙන ගුහාවට යන්න වෙනවා. ඒ ගුහාව ඇතුලේ තමයි නිධානය තියෙන්නේ . ඒත් මේ බලන්නකෝ ඇනා , මේ සිතියමේ පිටිපස්සේ පුංචි අකුරින් මොනවදෝ ලියලා තියෙනවා . ඔයාටත් පේනවා ද ඇනා ? ’’ ලිලී කිවුවා .

“ ඔව්මයි ඒත් මට කිසි ම දෙයක් පැහැදිලි ව පේන්නෙ නැහැ . ඔයාට පේනවා නම් මටත් ඇහෙන්න කියවන්නකෝ . ’’ ඇනා කිවුවා .

“ ආ හරි , මට ටිකක් විතර පේනවා . මට පේන විදිහට මෙතන තියෙන්නේ කවියක් . ඉන්නකෝ මම ඔයාටත් ඇහෙන්න කියවන්නම් ,

‘කන්දක් උඩ ලොකු ගුහාවක් ඇත

ගුහාවේ ලොකු නිදහනක් ඇත

නිදහනේ පැණි රස ද බොහෝ ඇත

ඉර එළියෙන් රන් දිලිසෙනු ඇත ’

ඒත් ඒකෙ තේරුම මොකක් ද ?'' ලිලී ඇසුවා .

" අනේ මන්ද. අපි දැන් යමුකෝ . අපිට මේ කවියත් කොහේදී හරි ම උදවු වේවි.'' ඈනා කිවුවා .

මෙහෙම කියමින් ලිලී සහ ඈනා පුදුම අශ්වයා සමඟ කැලය ළඟට ආවා .

ඊට පස්සෙ අශ්වයා මේ දෙන්නත් එක්ක කැලය මැදින් යන්න පටන් ගත්තා .හරි ම අඳුරුයි . ලිලී යි ඈනා යි හොඳට ම බය වුණා . නමුත් අශ්වයා වේගයෙන් ගමන් කළා. ටික වෙලාවක් යද්දි කැලය ඉවර වුණා . ඒ කෙළවර ලොකු ම ලොකු ගඟක් තිබුණා. පුදුම අශ්වයා ඒ ගඟ ළඟ ටිකක් නතර උණා.

"මෙච්චර ලොකු ගඟක්? අපි කොහොම ද මේකෙන් එගොඩ වෙන්නේ '' ඈනා සහ ලිලී ගං ඉවුරෙහි සක්මන් කරමින් කල්පනා කළා.

අශ්වයා ජලය පානය කොට ඈනා සහ ලිලී ට පිට උඩට නගින්නට සංඥා කළා. මුහුණෙන් මුහුණ බලාගත් දෙදෙනා අශ්වයාට අවනත වී නැවතත් පිට උඩට නැන්ගා.

එසැනින් හීයක් මෙන් උඩට නැගුණු අශ්වයා ක්ෂණයකින් එගොඩට ගොඩ බැස්සා. තව ටික දුරක් ගමන් ගත් විට දක්නට ලැබුනේ ගල් පර්වත වලින් පිරුණු උස කන්දකි.

“ මට අවසර නැහැ මෙතැනින් එහාට ඔයාලත් එක්ක එන්න. මෙතනින් ඉදිරියට හැමදේම ඔයාලා දෙන්නාට තනියම කරන්ඩ වෙන්නේ” පුදුම අශ්වයා කිවුවා .

“ ඔහොම පොඩ්ඩක් ඉන්න. ඔයාට කතා කරන්නත් පුළුවන් ද ?” ලිලී අශ්වයාගේ ගෙල අතගාමින් ඇසුවා .

“ ඔව් ඇත්තෙන්ම.මට කතා කරන්න පුළුවන්.ඔය ළමයි දැන් ඒ ගැන නොසිත පමා නොවී නිධානය සොයා ගැනීමට යන්න ඕනි” පුදුම අශ්වයා කන්ද දෙසට හැරෙමින් කිවුවා .

අර පේන කන්ද හරිම භයානකයි. කන්ද නැඟීම එතරම් පහසු නොවේවි. තැනින් තැන ආලෝකය විහිදුවන මායා පැළෑටි තියෙනවා. ඒවා අල්ලන්නවත් පාගන්නවත් එපා. බැරිවෙලාවත් මේ පැළෑටි ඇගේ ගෑවුනොත් පැළෑටියෙන් ක්ෂණිකව මුල් ගොඩාක් ඇවිත් ඔයාලව ගැටගහගන්නවා. ඒ නිසා මේ ගමන හරිම පරිස්සමින් යන්න ඕනි.පැළෑටි වලින් විහිදෙන ආලෝකයෙන් තමයි ඔයාලට යන මාර්ගය හදුනාගන්න වෙන්නේ.

කන්ද මුදුනට යද්දි තැනිතලාවක් හම්බවේවි. ඒ තැනිතලාවේ තියෙන ගුහාවෙ තමයි නිධානය තියෙන්නේ. ඒ ගුහාව ඇතුළට යන්න . හරි ම කළුවරයි. එහෙත් බිය නොවන්න. වව්ලන්, සරපයන් වැනි සතුන් පැමිණ පහර දේවි. ඒ කුමක් සිදු වූවත් ඉදිරියට ම යන්න . එවිට නිධානය හමු වේවි. දැන් ඔය ළමයි යන්න. මතක ඇති ව මම දුන්න උපදෙස් ඒ විදිහට ම පිළිපදින්න. එහෙම කළොත් නිධානය ගන්න පුළුවන් වේවි .

ඒ වගේ ම මේ කුඩු ටිකත් ගන්න. කාට හරි තුවාලයක් වුණොත් මේ කුඩු ටිකක් දාන්න . එතකොට තුවාලය හොඳ වේවි . මම එහෙනම් යනවා . සුබ ගමන් .

"හොඳයි පුදුම අශ්වයෝ.බොහො ම ස්තූතියි අපිට මෙතැනට එන්න උදවු කළාට." ඇනා කිවුවා .

දැන් නම් මේ ගමන ගැන හිතේ තැතිගැන්මක් තියෙන්නේ. අපිට මොනවා වෙයිද? මොන මොන දේට මුහුණ දෙන්න වෙයිද? හිතාගන්නවත් බෑ. ආපහු හැරිලා ගෙදර යන්නත් හිතෙනවා. ඇනා ආපසු හැරුණා. ඒත්..... ඒත්......

කෝ මේ අශ්වයා ? එතකොට පුදුම අශ්වයා හිටියේ නැහැ.

" ලිලී කෝ අශ්වයා ? " ඇනා ඇසුවා .

" අර බලන්න ඇනා. අර ඈත අහසේ පුදුම අශ්වයා පියාඹලා යනවා." සුදු පාට පුළුන් කැටි වලාකුළු අතරින් ඌ නොපෙනී ඈතට ඈතට ගියා .

"අපිට දැන් තනියෙන් ම තමයි මේ වැඩේ කරන්න වෙන්නෙ. අපි කොහොම හරි නිධානය හොයා ගනිමු." ඇනා කිවුවා .

ඊට පස්සෙ මේ දෙන්නා කන්ද නඟින්න හිතාගෙන කන්ද දිහා බැලුවා. කන්දේ උස දැකලා හිතට බයක් දැනුනත් කන්ද නඟින්න පටන් ගත්තා . හරිම කළුවරයි. අශ්වයා කියපු අර එළිය විහිදුවන පැළෑටි තැනින් තැන තිබුණා. සමහර ඒවා බිම්මල් වගේ. සමහර වා කුඩා පැළෑටි. කොහොම වුනත් ඒවායින් ලැබෙන ආලෝකය නිසා අඳුර තරමක් අඩු වී අපි දෙන්නට දෙන්නා පෙනෙන්න ගත්තා.



ලිලී පිටුපස ඇනා හිමින් හිමින් කන්ද නගින්න පටන් ගත්තා. අධාරකයක් ලෙස පොල්ලක් අතට ගන්න ලිලී අමතක කළේ නෑ. ගමන් මහන්සියටත් ආරක්ෂාවටත් ඒක රුකුලක් වුණා. මොකද මේ ගොල්ලන්ට කන්ද නගින්න වුනේ ගල්, මුල් වලින් පිරිච්ච දුෂ්කර මාර්ගයක් හරහා. ලිලී අතේ තිබුණ පොල්ලෙන් මාර්ගය සකස් කරමින් ඉදිරියෙන් ගමන් කළා.

"ආ.....ආ.....ආ...."

ලිලී ගේ කකුල තියපු ගල කැඩී ලිලී ටිකක් දුර පහලට වැටුණා . ඇනා ඉක්මනින් ලිලී වැටුණු තැනට දිව ආවා .

" ලිලී මොකද වුණේ ."

"මම කකුල තියපු ගල කැඩිලා මාව වැටුණා . ''

" ඔයාට තුවාල ද ? "

"අත ටිකක් තුවාලයි. පොඩි තුවාලයක්.''ලිලී කිවුවා.

ලිලී වටා දුඹුරු පැහැති මුල් වර්ගයක් එතෙන බව දුටු ඇනා වහාම ඇය කැටුව කන්ද දෙසට වේගයෙන් දිවුවා.

"ලිලී ඉක්මන් කරන්න. අර අශ්වයා කියපු මායා පැළෑටිවල මුල් ඔයාව ඔතා ගන්නයි යන්නේ.එන්න අපි දුවමු. මායා පැළෑටිවල ගෑවෙන්නේ නැතුව එන්න"

තමන් සතු උපරිම ශක්තිය යොදමින් ලිලීවත් ඇදගෙන ඇනා දුවන්න පටන් ගත්තා. බොහෝ දුරක් වේගයෙන් දුව ආ ලිලී පිටුපස බලා මායා මුල් නොමැති බව හඳුනා ගත්තා.

"මට නම් දැන් හොඳටම මහන්සි යි." ගස් කොටයක් මත හති දමමින් හිඳ ගත් ලිලී කිවුවා. ඇනා ලිලී ළඟින් හිඳ ගත්තා.

"අපි අනූ නවයෙන් බේරුණේ. තව පොඩ්ඩෙන් මායා පැළෑටියේ මුල ඔයාව හිර කර ගන්නා. වැටුණ වෙලාවේ පැළෑටියක් පෑගෙන්න ඇති. පහළට පෙරළුණු නිසා මුල් වලට ඔයාව ඉක්මනින් ඔතා ගන්න බැරි වුණා. ඒ නිසයි අපි බේරුණේ." ඇනා කිව්වා.

"අම්මෝ...... ඇති යාන්තම්. අපි මීට වඩා පරිස්සමින් වෙන්න ඕනි ඇනා"

ලිලීයි, ඈනායි ආයෙමත් කන්ද උඩට නගින්න පටන් ගත්තා . තවත් ටික දුරක් යන කොට ටිකක් ඈතින් මොනවදෝ දිලිසෙනවා මේ දෙන්නා දැක්කා . ඔවුන් ඒ පැත්තට ගියා .

“ මේ මොකක්ද මේ ? ’’ ලිලී ඇසුවා .

“ මේක යතුරක් නේද ? ’’ ඈනා ඇසුවා .

“ ඔව් මේක යතුරක් තමයි. අපි මේක ගමු ද ? ’’ ලිලී ඇසුවා .

“ ගන්න නම් පුළුවන් ඒත් අපිට පුදුම අශ්වයා යතුරක් ගැන කිවුවේ නැහැනේ.’’ ඈනා කිවුවා.

“ ඒත් අපිට මේක ඕන වේවි. මේ යතුර දිලිසෙනවා කියන්නේ මේක විශේෂ යතුරක් ’’ ලිලී කිවුවා .

“ හරි එහෙනම් අපි මේක ගමු . ’’ ඈනා කිවුවා .

ලිලී යතුර ළඟ ට ලං වුණා. ඒකෙන් විහිදෙන ආලෝකයෙන් ඇස් නිලංකාර වුණා. ඇස් තද කර පියා ගත් ලිලී යතුර ඇදලා ගත්තා . එතකොට ම උඩ තිබුණු ගලක් පෙරලිලා මේ දෙන්නා ඉන්න පැත්කට ආවා . ලිලී එහා පැත්තෙ තිබුණු වැල් පොටක එල්ලුණා.

“ඈනා........ ඔන්න ගලා......ක්. මේ පැත්තට එන්න. ඉක්මන් කරන්න. මගේ කකුල් දෙකේ එල්ලෙන්න”

ගල පෙරලී පහළට ගියා. දෙදෙනා වැල් පොටෙහි එල්ලී පැද්දෙමින් දිවි බේරා ගත්තා.

“ලිලි මට නම් දැන් බඩගිනී. වතුරත් ඉවරයි. අපි අර ගහේ තියෙන ගෙඩි කඩාගෙන කමු”

“පොඩ්ඩක් ඉවසන්න ඇනා. අපි මේ කන්දේ තියෙන ගස් ගැන හරියටම දන්නේ නෑනේ. සමහර විට විෂ ගෙඩි වර්ගයක් වෙන්නත් පුළුවන්. යතුර ලඟ තියෙන ගසක් නිසා මායා ගහක් වෙන්නත් පුළුවන්. මේ ගහේ ගෙඩි සතෙක් වත් කාපු බවක් පේන්නේ නෑ.” එහෙම කියපු ලිලී නැවත ගමන පිටත් වෙන්න ඉස්සර වුණා.

මේ දෙන්නා යතුරත් අරගෙන කන්ද උඩට ම නැග්ගා. කන්ද උඩ පුංචි පොකුණක වතුර තිබුණා. ලිලී පරික්ෂාකාරීව පොකුණ වටේ ඇවිද්දා. පොකුණට ආපු හා ගියපු සතුන්ගේ අඩි සලකුණු ඇති බව ඇයට දක්නට ලැබුණා. දෙන්නා ම දෝතට වතුර රැගෙන පිපාසය නිවෙන තුරු වතුරත් බිවුවා. මුහුණ සෝදා විඩාව නිවා ගත්තා.බෝතලයකට වතුර ටිකකුත් පුරවා ගත්තා.

“ ලිලී.... ඔයාගේ තුවාලයෙන් තවමත් ලේ එනවා. අපි අශ්වයා දුන්න බෙහෙත් කුඩු ටිකක් දාමු.” ඇනා කුඩු ටිකක් ගෙන තුවාලයට ඉස්සා

“මේ බලන්න ලිලී, මෙතැන තුවාලයක් තිබුණ ද කියලාවත් හොයා ගන්න නෑ’’ ඇනා පුදුමයෙන් කිවුවා .

“ ඔව්මයි හරි ම පුදුමයි . මට දැන් රිදෙන්නෙත් නැහැ . මේ පුදුම අශ්වයාගේ මායා කුඩුවල බලය නිසා තමයි ඉතින්’’

“ඒක නෙවෙයි අර බලන්නකෝ . අපේ පුදුම අශ්වයා කිවුව ගුහාව තියෙනවා . ’’ ඇනා කිවුවා .



කැලය මැදින් අඳුරු ගුහාවක් පෙනුණා. ඒ අවට මායා පැළැටි දක්නට ලැබුණා. ගස් වටා වැල් එතී ඝණව වැඩී තිබුණා. මොකක්දෝ බියකරු ගුප්ත ගතියක් පරිසරය පුරා දක්නට ලැබුණා. ඇනා සහ ලිලී තැතිගැන්මෙන් ගුහාව දෙස බලා සිටියා.

ලිලීගේ අතින් තදින් අල්ලා ගත් ඇනා ගුහාව ඇතුලට ගියා. ඇතුල හරි ම අඳුරුයි . වව්ලෝ ඇවිත් කරදර කරන්න පටන් ගත්තා. මේ දෙන්නාට පුදුම අශ්වයගේ උපදෙස මතක් වුණා .

" මතක ද ලිලී පුදුම අශ්වයා කිවුවා, කළුවරටවත් වව්ලන්ටවත් බය නොවී ඉස්සරහට ම යන්න කියලා'' ඇනා ඇසුවා

" ඔව් අපි බයනැති ව ඉස්සරහට ම යමු."

මේ දෙන්නා බය නැති ව ගුහාව ඇතුළට ම ගියා . හරි ම කළුවරයි. කිසි ම දෙයක් පෙනෙන්නේ නැති තරමට කට්ට කළුවර යි.

"දැන් මෙකද කරන්නේ. මේ කළුවරේ මොකුත්ම කරන්ඩ බෑ." ඇනා කිව්වා.

"මට හොද අදහසක් ආවා. එන්න ඇනා.....අපි ආපහු ගිහින් එළියක් අරන් එමු." ලිලී ඇනාගේ අතින් අල්ලාගෙන ගුහාවෙන් එළියට ආවා. මායා පැළයක් අසලට ගිය ලිලී ඒ අසල හාරන්න පටන් ගත්තා.

"එපා...ලිලී...එපා..." ඇනා බියෙන් කෑගැහුවා. ලිලී පැළෑටිය වටේ පස බුරුල් කර, ගසකින් ගලවා ගත් පොත්තක් උඩ ට හිමින් සිරුවේ මායා පැළය ගත්තා. දැන් ඒක ගහේ පොත්තෙන් අල්ලාගෙන ඕනි තරම් දුර පැළය අරන් යන්න පුළුවන්. ඇනා පුදුම වුණා.

පාන්දර ඉර පායමින් තිබුණත් ඝනව වැඩුණු ගහ කොළ නිසා සිරු එළිය පහළට ගලා එන්නේ නැත. නමුත් ගුහාව තුළ නම් අඳුරුම අඳුරුයි. මායා පැළයේ එළියෙන් ගුහාව තුළට දෙදෙනාම ඇතුළු වුණා. මේ මායා පැළයේ එළිය නිසා වව්ලන් ඈතට පියඹලා ගියා.

ටික දුරක් යන කොට මේ දෙන්නාට ගල් ගුහාව මැද තරමක් උස ගල් කුළුණක් මත පෙට්ටියක් දක්නට ලැබුණා. ගමනේ අවසාන ස්ථානය වෙත ලගා වී ඇති බව ඇනා ට හා ලිලීට තේරුණා.



ඇනාට සන්තෝසයක් දැනුණා. තිබුණු කලබලයට වගේ ම සතුටට ඇනා නිධානට ළගට දුවගෙන ගියා

“ඇනා පොඩ්ඩක් ඉන්න. මොකක් හෝ අනතුරක් ලඟ තියෙන්න පුළුවන්” ලිලීගේ ඒ වචන ටික කියලා ඉවර වෙන්නත් කළින්

“ජබෝස්.....”සද්දයකුත් එක්ක

“ලිලී.......ලී” ඇනා කෑගහන සද්දේ ඇහුණා.

නිධානයේ ආරක්ෂාවට නිධානය ඉදිරිපිට තිබූ දිය පිරුණු වඟුරට ඇනා වැටී ඇති බව ලා එළියෙන් ලිලීට පෙනුණා.

“ අනේ ලිලී මාව බේර ගන්න, මාව බේර ගන්න . ” ඇනා කෑ ගැසුවා .

ලිලී එහා මෙහා ඇවිදිමින් කල්පනා කළා. වට පිට බැලුවා. කොහොමද ඇනාව බේරා ගන්නේ. නිධානයක් ගන්න බිල්ලක් ඕනි කියලා දවසක් අත්තම්මා කතන්දරයක් කියද්දි කිව්වා ලිලීට මතක් වුණා. අනේ ඇනා බිලි ගනීවිද?

" ලිලී මොනවාහරි ඉක්මනින් කරන්න. මාව ටික ටික මේ මඩේ එරෙනවා''

"බය වෙන්ඩ එපා ඇනා මං කොහොම හරි ඔයාව බේරා ගන්නවා."

ගුහාව ඇතුළේ ගහක කොටයක් ඇති බව දුටු ලිලී එය ඉතා අමාරුවෙන් වගුර දෙසට පෙරලාගෙන ගොස් වගුරට දැම්මා. ඇනා අමාරුවෙන් කොටයේ එල්ලීගෙන කොටය උඩට නැංගා.

"ඇනා බලාගෙන. කොටය පෙරලෙයි."

ඇනා කොටය උඩ ඉදගෙන කකුල් දෙකෙන් පස්සට ශක්තිය දී ඉදිරියට තල්ලු වී, ලිලීගේ අතේ එල්ලීගෙන ගොඩට ආවා.

"අපි කලබල නැතිව මේ වැඩේ කරන්න ඕනි. බලන්ඩ තව ඩිංගෙන් අපි අනතුරේ. අපි දැන් කොහොමද මේ නිධානය ළඟට යන්නේ?"

" අපිට කවුරුන් හෝ පාඩමක් උගන්නලා තියෙන්නේ." ඇනා කිවුවා.

"ඒ කියන්නේ?" ලිලී කල්පනා කළා.


“ ඇයි අනේ. මේ කොටයෙන්ම අපි නිධානය ලඟට යමු”

දෙදෙනාම කොටයට නැඟ ශක්තිය යොදමින් ඉදිරියට තල්ලු වී නිධානය වෙත ලං වුණා.

“ ඒ මොකක්ද ලිලී එතන තියෙන පෙට්ටිය. මම හිතන්නේ ඒ තියෙන්නේ නිධාන පෙට්ටිය .’’ ඇනා සතුටින් ඇසුවා.

“ ඔව් ඒ තියෙන්නෙ නිධාන පෙට්ටිය තමයි.’’ ලිලී කියුවා .

මේ දෙන්නා පරිස්සමින් නිධාන පෙට්ටිය ළඟට ගියත් ඒක අරින විදිහ දැනගෙන හිටියේ නෑ. එකපාරට ම ලිලීට කන්ද උඩ දී හම්බ වුණ යතුර මතක් වුණා. මේ දෙන්නා යතුර සිදුරට දාලා බැලුවා. නිධාන පෙට්ටිය ඇරුණා . ඒ නිධානය පිරිලා තිබුණේ පැණි රසවලින් .



" පොඩ්ඩක් හිතලා බලන්න ඇනා ,

'කන්දක් උඩ ලොකු ගුහාවක් ඇත
ගුහාවේ ලොකු නිදහනක් ඇත
නිදහනේ පැණි රස ද බොහෝ ඇත
ඉර එළියෙන් රන් දිලිසෙනු ඇත '

ඒ කවියේ කියපු විදිහට ම කන්දක් උඩ ලොකු ගුහාවක් තිබුණා , ගුහාවේ ලොකු නිධානයක් තිබුණා , නිධානයේ පැණි රස ගොඩක් තිබුණා , ඒත් මොකක් ද මේ 'ඉර එළියෙන් රන් දිලිසෙනු ඇත ' කියන්නේ'' ලිලී ඇහුවා .

"දැන් ඉර පායලත් ඇති.අපි මේක එළියට අරගෙන යමු.'' ඇනා කිවුවා .දෙන්නා පරිස්සමින් නිධාන පෙට්ටිය එළියට අරගෙන ගියා. ඉර එළිය පෙට්ටියට වැටෙනකොටම අර පැණි රස කැම රත්තරං බවට පත් වෙලා දිලිසෙන්න පටන් ගත්තා.

එකපාරට ම ,

" ලිලී , ලිලී නැගිටින්න . අද නිධන් සෙවීමේ තරඟයක් තියනවා කියුවා නේද ? '' ලිලීට ඒ ඇසුණේ අම්මාගේ හඬයි.

ලිලී නැගිට්ටා .

"කෝ ඇනා , පුදුම අශ්වයා , නිධාන පෙට්ටිය ''ලිලී ඇසුවා .

ලිලී ඒ දුටුවේ සිහිනයක් බව තේරුණා. "ඒක සුන්දර සිහිනයක්" ලිලී තමාටම කියා ගත්තා.

***නිමි***

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයන්ගේ පිළිගැනීමයි.නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කිරීමට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්නාදෙන නූතන පාසල, නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොත්පත් ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්නා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අනෙක් කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොත්පතින් දරුවන් දුරස්වීම වැළැක්වීමට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි.පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත්, යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තා සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනි, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටත්, දියවඩන නිලමේතුමා ඇතුළු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටත් මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)